(සියලුම හිමිකම් ඇවිරිණි)
(All Rights Reserved)

# පාසල් වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවත්වෙන විභාගය

I පත්‍රය

## නැණ ලොවට පා නඟන හපනුන්ට මඟ කියන

## ''අදිති''

05

**කාලය - පැය 1 යි**

**විභාග අංකය ......................................**

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් :-**

* ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
* තුන්වන පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබේ විභාග අංකය ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු තුන බැගින් දී ඇත. ඒවා අතරෙන්, එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
* කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.


## උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි


| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණු නිවැරදි ය. | V/I/S/CH |


✦ පහත දී ඇති රූප නිරීක්ෂණය කර 1 හා 2 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. කොටුව තුළ දී ඇති චිත්‍රයට වඩාත් සමානවන සේ ඇඳ ඇති චිත්‍රය කුමක්ද?






(i)




(ii)




(iii)

02. X රූපයට සමාන රූපයක් ලබා ගැනීම සඳහා Y රූපයේ සිදු කළ යුතු වෙනස්කම් ගණන කීයද ?



x රූපය



y රූපය

(i) 2 (ii) 3 (iii) 4

✦ අංක 3 සහ 4 ප්‍රශ්නවල, කොටුව තුළ ඇති කාණ්ඩයට ඇතුළත් කිරීමට වඩාත් නොගැළපෙන රූපය කුමක් ද?

03.

| |
|---|
| ඕලු |
| නෙළුම් |
| මානෙල් |


(i) කුමුදු (ii) කෙකටිය (iii) බෝගන්විලා


04.

| |
|---|
| අතකොළුව |
| වරක්කලය |
| කියත |


(i) ලෙවලය (ii) බුරුමය (iii) නියන

05. මෙම රූපය සම්පූර්ණ කිරීමට කුමන රූප කැබැල්ල සම්බන්ධ කළ යුතුද?






(i)




(ii)



(iii)


✦ 06 හා 07 ප්‍රශ්නවල තල දර්පනයක් ඉදිරියේ තැබූ රූප කට්ටලයක් පහත දැක්වේ. තල දර්පනය තුළින් බැලූ විට දැකිය හැකි නිවැරදි ප්‍රතිබිම්බය තෝරන්න.

06.



(i) (ii) (iii)


07.



(i) (ii) (iii)

✦ 08 හා 09 ප්‍රශ්නවල රූප පහ බැගින් දී ඇති අතර ඉන් දෙකක් යොදා ගෙන එහි ඇති තවත් රූපයක් ගොඩනගා ගත හැක. එහි නිවැරදි පිළිතුර වන්නේ,


08.



(a) (b) (c) (d) (e)

(i) e සෑදීමට c හා d (ii) a සෑදීමට b හා c (iii) b සෑදීමට c හා e

09.



(a) (b) (c) (d) (e)


(i) b සෑදීමට a හා d (ii) b සෑදීමට a හා b (iii) e සෑදීමට d හා c

✦ 10 හා 11 ප්‍රශ්නවල රටාව හඳුනාගෙන හිස්තැනට එන සංඛ්‍යාව තෝරන්න.

10.


| | | |
|---|---|---|
| 9 | 70 | 7 |
| 8 | 81 | 9 |
| 7 | ........ | 8 |

(i) 56 (ii) 64 (iii) 72

11. 



(i) 28 (ii) 36 (iii) 48

12. පහත රූපයේ දක්නට ලැබෙන ත්‍රිකෝණ සංඛ්‍යාව කොපමණ ද?



(i) 6 (ii) 7 (iii) 9

13. පහත සටහනේ දැක්වෙන ආකාරයට මෙම රෝදය ආරම්භක තිතේ සිට ඊළඟ තිතට කරකැවූ විට වටයක් සම්පූර්ණ වෙයි. ඒ අනුව රෝදය වටේ දිග ප්‍රමාණය කොතෙක් ද?




(i) 27cm
(ii) 36cm
(iii) 55cm

14. පළමු ඔත්තේ සංඛ්‍යා 10 ත් පළමු ඉරට්ටේ සංඛ්‍යා 10 ත් අතර වෙනස කීයද?
(i) 10 (ii) 22 (iii) 48

15. 2020 වසරේ ජනවාරි 1 වන දා අඟහරුවාදා නම්, 2021 වර්ෂයේ ජනවාරි 05 වැනිදා කවදා ද?
(i) සිකුරාදා (ii) සෙනසුරාදා (iii) සඳුදා

16. දවසක් කිසියම් වේලාවක දී එල්ලේ ක්‍රීඩාවේ දී යොදා ගැනෙන මීටර 6 ක් උස බයිස් කණුවකින් මීටර 24 ක සෙවණැල්ලක් වැටෙන අවස්ථාවක නෙට්බෝල් ක්‍රීඩාවේ යොදා ගැනෙන මීටර 3 ක් උස විදුම් කණුවකින් කොපමණ ද උස සෙවනැල්ලක් වැටේ ද?
(i) 12m (ii) 15m (iii) 18m

17. පාසල් උත්සවයකට සැරසීම සඳහා වර්ණ තුනකින් යුත් බැලුම් පැකට් තුනක් ගෙන ආ අතර එක් පැකට්ටුවක බැලුම් බෝල 150 ක් තිබුණි. එක් වර්ණයකින් බැලුම් බෝල තුන බැගින් ගෙන බැලුම් පොකුරු සෑදුවේ නම් සෑදූ බැලුම් පොකුරු ගණන කීයද?
(i) 50 (ii) 75 (iii) 150


18. පහත දක්වා ඇත්තේ ළමයෙකු විසින් කැඩපතකින් බැලූ විට බිත්ති ඔරලෝසුවේ සටහන් වූ වේලාවයි. ඒ අනුව සැබෑ වේලාව කීයද?

| 07.10 |
|---|

(i) 1.35 (ii) 2.35 (iii) 4.50

19. 1 සිට 100 තෙක් සංඛ්‍යා ලිවීමේදී 8 ඉලක්කම් ලියවෙන වාර ගණන කොතෙක් ද?
(i) 18 (ii) 20 (iii) 21


20. පහත දැක්වෙන්නේ ඝනකාභ තුනක් තබා ඇති ඇති ආකාරයයි. එහි දක්නට ලැබෙන මුහුණත් ගණන වනුයේ,



(i) 7
(ii) 8
(iii) 14

21. මිතුරෝ හතර දෙනෙක් රු.100.00 බැගින් එකතු කර, එකක් රු. 78.00 ක් බැගින් වූ අයිස් ක්‍රීම් හතරක් මිලට ගත්හ. පසුව ඉතුරු මුදල සමානව බෙදා ගත්තේ නම් එක් අයෙකුට ලැබුණු මුදල කොතෙක් ද?
(i) රුඃ 20.50 (ii) රුඃ 15.00 (iii) රුඃ 22.00

22. පහත ඝනකවල එක් එක් මුහුණතේ සටහන් වී ඇති ඉංග්‍රීසි අකුර අනුව, කවර අකුරු යුගලය ඝනකයේ ප්‍රතිවිරුද්ධ මුහුණත් දෙකක ලියා ඇත්ද?




(i) A, D (ii) A, C (iii) A, F

23. පාසල් කිහිපයක ශිෂ්‍යත්ව විභාගය සමත් පිරිමි ළමුන් ගණන ගැහැනු ළමුන්ට වඩා 5 ගුණයකින් වැඩි විය. මේ අතරින් එලෙස සමත් සිසුන් පිරිසක් නොවන්නේ,
(i) 30 (ii) 42 (iii) 37

24. මීනා ප්‍රශ්න පත්‍රයෙහි 6 සිට 20 තෙක් පිළිතුරු සැපයීමට මිනිත්තු 30 ක් ගත කළා ය. එම වේගයෙන්ම ඈ 29 සිට 57 තෙක් වන ප්‍රශ්නවලට පිළිතුරු සැපයුවේනම් ඒ සඳහා ගත කළ කාලය කොපමණ ද?
(i) මිනිත්තු 58 (ii) මිනිත්තු 60 (iii) මිනිත්තු 56

25. දී ඇති කොටු ජාලයේ හිස් කොටු වලට යෙදෙන අංක හා අකුරු තෝරන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | W | 9 | Q | 25 | ...... |
| Z | 4 | T | 16 | N | ...... |


(i) K, 36 (ii) J, 31 (iii) O, 34

26. සංඛ්‍යා අතර සම්බන්ධය තේරුම් ගෙන හිස් කොටුවලට ගැළපෙන සංඛ්‍යා දෙක තෝරන්න.

| | | | | |
|---|---|---|---|---|
| | + | | = | 8 |
| × | | + | | − |
| | + | 4 | = | |
| = | | = | | = |
| 12 | ÷ | | = | |

(i) 3 සහ 5 (ii) 2 සහ 6 (iii) 3 සහ 4

27. උතුල්, සමචතුරස්‍රාකාර කඩදාසියක් හා ත්‍රිකෝණාකාර කඩදාසි දෙකක් රූපයේ දැක්වෙන ආකාරයට එක මත එක තබා කඩඉරි දිගේ කපන ලදි. එවිට ලැබුණු හැඩතල කොටස් ගණන වූයේ,



(i) ත්‍රිකෝණ 2ක් සහ චතුරස්‍ර 5 කි.

(ii) ත්‍රිකෝණ 8ක් සහ චතුරස්‍ර 6 කි.

(iii) ත්‍රිකෝණ 4ක් සහ සෘජුකෝණාස්‍ර 2 කි.

28. පහත ඇති කවියෙන් කියවෙන්නේ,

මෝරුන් තල්මසුන් අතරේ ඇති පොරය
ඉස්සන් හාල් මැස්සන් හට කරදරය
උන් විඳ දරා ගන්නා මුත් හිරිහැරය
සමහර මසුන්ගේ ජීවිත දුක්බරය

(i) මෝරුන් තල්මසුන් පොරකන විට අනෙක් මසුන් හිරිහැර විඳින බවය.

(ii) කරදර විඳ දරා සිටීමට හුරු පුරුදු විය යුතු බවයි.

(iii) බලය වැඩි අය නිසා දුබලයින් පීඩාවට පත් වන බවය.

29. මෙවර ශිෂ්‍යත්ව විභාගයෙන් පළමුවැනියා වූ ඉරුදි ශිෂ්‍යයාවට පාසලේ විදුහල්පතිතුමා, ගුරුභවතුන් හත්දෙනා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමිය අතට අත දී සුභ පැතුවේ නම්, අතට අත දුන් වාර ගණන කීයද?

(i) 36 (ii) 72 (iii) 9

30. ක්‍රීඩා පිටියක සිටි 10 දෙනෙකු අතරින් 7 ක් කුඩ ඉහළාගෙන සිටි අතර, 6 දෙනෙක් හිස්වැසුම් පැළඳ සිටියහ. ඔවුන්ගෙන් සෑම කෙනෙක් ම එක්කෝ කුඩයක් ඉහළාගෙන, නැතහොත් හිස් වැසුමක් පැළඳ සිටියහ. සමහරු හිස්වැසුම් පැළඳ, කුඩ ද ඉහළාගෙන සිටියේ නම් එම පිරිස කොපමණ ද?

(i) 3 (ii) 6 (iii) 7


31. බසයක සිටින පිරිමින් සංඛ්‍යාව එහි සිටින ගැහැනුන් සිඛ්‍යාව මෙන් තුන් ගුණයක් වේ. තවත් ගැහැනු 4 දෙනෙකු බසයට නැගුනහොත් බසයේ සිටින පිරිමි හා ගැහැනු ගණන සමාන වේ. එවිට බස් රථයේ සිටින මුළු මගීන් ගණන කීය ද?

(i) 8 (ii) 12 (iii) 32

32. රයිනි දුවගේ උපන් දිනය සඳහා කේක් ගෙඩි සංඛ්‍යාවක් ගෙනෙන ලදි. ඉන් එකක් කැලි 20 ක ට කපන ලදි. එවිට කැලි 120 ක් ලැබුණි. කේක් ගෙඩියක් කැලි 24 කට කැපුවේ නම් කැලි කීයක් ලැබේ ද?

(i) 124 (ii) 136 (iii) 144

✦ 33 හා 34 ප්‍රශ්න සඳහා පහත දී ඇත්තේ පුද්ගලයෙකු නිවසේ සිට පාසලට ගිය ගමන් මාර්ගය දක්වෙන සටහනයි.




33. මෙම ගමනේ දී ඔහු දකුණට හැරුණු වාර ගණන කොතෙක් ද?

(i) 3 (ii) 4 (iii) 5

34. මෙම ගමනේ දී ඔහු වමට හැරුණු වාර ගණන කොතෙක් ද?

(i) 4 (ii) 5 (iii) 6

35. ගිත්මිට වඩා සිත්මි උස වන අතර යෂ්මි තරම් උස නොමැති නමුත් රිද්මිගේ උසට සමාන ය. වඩාත් උස වන්නේ,

(i) සිත්මි (ii) යෂ්මි (iii) ගිත්මි


36. මා ළඟ ඇති මුදලින් රු.24/= ක් අම්මාට දුන් පසු මා ළඟ ඇති මුදල දැන් අම්මා ළඟ ඇති මුදල මෙන් දෙගුණයකි. මුලින් මා ළඟ රු.212/= ක් තිබුණේ නම් දැන් අම්මා ළඟ තිබෙන මුදල වන්නේ,

(i) 70 (ii) 94 (iii) 188

37. නිවාසාන්තර ක්‍රීඩා උත්සවයේ මැරතන් ධාවන තරගයේ යෙදුණු ක්‍රීඩකයෝ විසි දෙනෙක් එක පොකුරට දුවති. මින්ත්තු 15 ක් පමණ ගත වෙත්ම එකිනෙකා පොකුරෙන් මිදී ඉදිරියට ඇදෙති. තරග අවසානය පෙනි පෙනී සිටියදී ම ජෝසප් දෙවනියාව පසු කළේ ය. ජෝසප් තරගයේ කී වැනියා ද?




(i) පළමු වැනියා (ii) දෙවැනියා (iii) තුන්වැනියා

38. දී ඇති රූපය කුඩා ඝනක කැට යොදාගෙන ගොඩනඟා ඇත. විශාල ඝනකයක් බවට පත් කිරීමට තවත් ඝනක කොපමණක් අවශ්‍ය වේද?



(i) 6
(ii) 7
(iii) 8

✦ දී ඇති පලතුරුවල මිල ගණන් ඇසුරු කර ගෙන පිළිතුරු තෝරන්න.

| | | |
|---|---|---|
|  |  |  |
| රු. 65.00 | රු. 29.00 | රු. 60.00 |

39. ඇපල් ගෙඩියක මිල වන්නේ,
(i) රු: 57.00 (ii) රු: 48.00 (iii) රු: 32.00

40. දොඩම්, ඇපල් හා අඹ දෙක බැගින් මිල දී ගත් විට ගෙවිය යුතු මුදල වන්නේ,
(i) රු: 154.00 (ii) රු.178.00 (iii) රු.18.00